# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා / බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 2020

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් බෞද්ධ උපදේශන ඩිප්ලෝමා /උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වීමට කැමති අපේක්ෂකයින්ගෙන් 2019.12.30 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

01 බෞද්ධ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව
02 බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාව

**ඇතුලත් වීමේ සුදුසුකම්:**

**01 බෞද්ධ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව:**

- අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.
- අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වී තිබීම සමග උපදේශන සේවාවේ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයක අවුරුදු 3ක පළපුරුද්ද (සනාතන සභාවේ අනුමැතියට යටත් ව)

**02 බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් පිරි නමන බෞද්ධ උපදේශන ඩිප්ලෝමාව සමත් ව තිබීම.
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන් සඳහා පිරිනමන බෞද්ධ උපදේශන දෑවුරුදු උසස් සහතික පත්‍ර පාඨමාලාව සමත් ව තිබීම.
- වෙනත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන බෞද්ධ උපදේශන ඩිප්ලෝමාවක් සමත් ව තිබීම හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන මනෝවිද්‍යාව හෝ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් ව තිබීම.

**පාඨමාලා කාලයඃ**

බෞද්ධ උපදේශන ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා පාඨමාලාවඃ අවුරුදු 01

**මාධ්‍යය - සිංහල**

**පාඨමාලා ගාස්තුඃ**

**බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව**

| | | |
|---|---|---|
| පාඨමාලා ගාස්තු | - | රු. 36,500/- |
| ලියාපදිංචි ගාස්තු | - | රු. 1,500/- |
| විභාග ගාස්තු | - | රු. 2,000/- |
| | | රු. 40,000/- |

**බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

| | | |
|---|---|---|
| පාඨමාලා ගාස්තු | - | රු. 39,000/- |
| ලියාපදිංචි ගාස්තු | - | රු. 1,500/- |
| විභාග ගාස්තු | - | රු. 2,000/- |
| පුස්තකාල ගාස්තු (ආපසු ගෙවන) | - | රු. 1,000/- |
| පුස්තකාල ගාස්තු (ආපසු නොගෙවන) | - | රු. 1,500/- |
| | | රු. 45,000/- |

**(ගාස්තු වාරික දෙකකින් ගෙවිය හැකි අතර පළමු වාරිකය ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතුය).**

**පාඨමාලා ආරම්භය හා පවත්වන ස්ථානයः**

සියලු පාඨමාලා පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 දී පැවැත්වේ.

**බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාවः**

සෑම සෙනසුරාදා දිනකම පෙ.ව. 9.00 සිට ප.ව.2.30 දක්වා

**උසස් ඩිප්ලෝමා පාඨමාලාවः**

සෑම ඉරිදා දිනකම පෙ.ව. 9.00 සිට ප.ව.2.30 දක්වා

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරයः**

අයදුම්පත් පැමිණ ලබා ගන්නේ නම්, 2019.12.24 දින දක්වා සතියේ වැඩ කරන දිනවල හා සෙනසුරාදා දිනවල ප.ව. 4.00 ට පෙර පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ සරප් කවුළුවට හෝ දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ය.

තැපැල් මගින් අයදුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි **රු. 500/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද 9”x4” ප්‍රමාණයේ රු. 15/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. **චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **“බෞද්ධ උපදේශන පාඨමාලාව සඳහා අයදුම්පත්‍ර “යනුවෙන්** සඳහන් කළ යුතු ය.

අන්තර් ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු.500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ සරප් කවුළුවට රු.500/-මුදල ගෙවීමෙන් ලබා ගන්නා ලද ලදුපත සමඟ අයදුම්පත භාරදිය යුතුය.

**සැ.යු. - බැංකුවට මුදල් ගෙවීමේ දී ලදුපතෙහි තැන්පත්කරුගේ නම සඳහන් ස්ථානයේ තම නම ඉදිරියෙන් “BC/Dip” යන සංකේත අංකය සඳහන් කර ඒ යටතේ ගෙවීම කළ යුතුය.**

නියෝජ්‍ය ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත" කොළඹ 07.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.12.30 වේ. අයදුම්පත් තැපැල් මගින් එවන්නේ නම් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. **අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සැ.යු - 2019 වසරට සිසුන් ලියාපදිංචි කිරීම සඳහා පළ කරන ලද දැන්වීමට අනුව අයදුම්පත් එවනු ලැබූ අපේක්ෂකයින් නැවත ඉල්ලුම් කළ යුතු නැත.**
**වැඩි විස්තර සඳහාः 011-2580609**

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
214 බෞද්ධාලෝක මාවත, කොළඹ 07
2019.11.29